# 2019 - ජනාධිපතිවරණය - අතුරු වාර්තාව

මෑත ඉතිහාසය තුළ පවත්වන ලද ජනාධිපතිවරණ අතුරින් නියමිත  කාලය අවසන් කර පැවැති ජනාධිපතිවරණය  2019 නොවැම්බර් 16 වන දින සාමකාමීව අවසන් වූ බව අපගේ නිරීක්ෂණයයි. 1982 සිට 2019 දක්වා පැවැති මැතිවරණය අතරින් සාමකාමී හා නිදහස් මැතිවරණය මෙවර ජනාධිපතිවරණය විය. පූර්ව මැතිවරණ කාලය තුළත් නිහඬ කාල සීමාව තුළත්, මැතිවරණ දිනයේත්, ප්‍රචණ්ඩත්වය  සාපේක්ෂව අවම මට්ටමක වියි එහෙත් මැතිවරණ ප්‍රතිඵල  ප්‍රකාශ වීමෙන් අනතුරුව පැවැති තත්ත්වය පූර්ව කාලය හා සසඳන විට  සතුටුදායක නොවීය. එහෙත් එයද බරපතල තත්ත්වයකට වර්ධනය නොවීය. කෙසේ වෙතත් සමස්ත මැතිවරණය පසුගිය මැතිවරණ හා සැසඳීමේදී දියුණු දේශපාලන භාවිතාවන් කරා යොමුවූ මැතිවරණයක් බව සඳහන් කල හැකිය.

පහත සංසන්දනය හරහා මේ පිළිබඳව පැහැදිලි අදහසක් ලබාගත හැකි අතර මෙය හුදෙක් සංඛ්‍යාත්මක සංසන්දනයක් වන අතර එමගින් නිවැරදිම චිත්‍රයක් නිරූපනය නොවේ. මක්නිසාද යත් පසුගිය කාලයට සාපේක්ෂව මේ වන විට තොරතුරු ගලායාමේ ප්‍රවේශය පුළුල් වී ඇති බැවිනි. 2015 ට පෙරාතුව බොහෝ දුරට පැමිණිලි යොමු වූයේ ෆැක්ස් මගින, දුරකථනයෙන් හා ලිපි මගින් පමණි. එහෙත් අද ප්‍රවේශ ගණනාවක් හරහා තොරතුරු  පැමිණිලි ලැබෙන අතර තොරතුරු ලබාදිය යුතු ආයතන (මැතිවරණ කොමිසම  /නිරීක්ෂණ සංවිධාන) පිළිබඳ ජනතාව පුළුල් අවබෝධයකින් කටයුතු කරන බැවින් ඉතා කුඩා  සිදුවීමක් පවා බලධාරීන් වෙත යොමු කිරීමට දේශපාලන පක්ෂ හා ජනතාව ක්‍රියාකරනු දැකිය හැකිය. ඒ අනුව අතීතය සමග සංසන්දනයේදී සංඛ්‍යාත්මක අඩුවීමට වඩා යහපත් තත්ත්වයක් අප උදාකර ගෙන ඇත. ඒ පිළිබඳව ගෞරවය රජයට,  මැතිවරණ දෙපාර්තමේන්තුවට, කොමිසමට, පොලිස් දෙපාර්තමේන්තුවට, නිරීක්ෂණ සංවිධාන හා සිවිල් සංවිධානවලට, දේශපාලන පක්ෂ ප්‍රමුඛ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාටම හා සමස්ත ජනතාවට ද හිමිවිය යුතුය.

| | **සිද්ධීන් වලට මැතිවරණ / අනෙකුත් නීති උල්ලංඝනයන් 2010/ 2015/ 2019 හා සංසන්දනාත්මකව** | **2010** | **2015** | **2019** |
|---|---|---|---|---|
| 1 | මනුෂ්‍ය ඝාතන | 4 | 0 | 0 |
| 2 | පහර දීම් | 168 | 57 | 32 |
| 3 | පැහැර ගෙන යාම් | 1 | 1 | 0 |
| 4 | බෝම්බ ප්‍රහාර | 2 | 1 | 0 |
| 5 | වෙඩි තැබීම් | 23 | 10 | 0 |
| 6 | නිශ්චල දේපළ වලට හානි කිරීම් | 25 | 18 | 3 |
| 7 | චංචල දේපල වලට හානි කිරීම | 18 | 17 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| 8 | තර්ජනය කිරීම හා බිය වැද්දීම | 55 | 36 | 10 |
| 9 | දේශපාලන පක්ෂ කාර්යාල වලට හානි කිරීම් හා ගිනිබත් කිරීම | 206 | 50 | 22 |
| | **<u>බරපතල ප්‍රචන්ඩ ක්‍රියාවන්ට අදාල නීති උල්ලංඝනයන් එකතුව</u>** | **<u>502</u>** | **<u>190</u>** | **<u>68</u>** |
| 10 | රාජ්‍ය දේපළ හා බලය අයුතු ලෙස භාවිතය | 57 | 194 | 142 |
| | **<u>රාජ්‍ය බලය දේපළ නිළධාරීන් අයුතු ලෙස භාවිතට අදාල නීති උල්ලංඝනයන් එකතුව</u>** | **<u>57</u>** | **<u>228</u>** | **<u>199</u>** |
| | **<u>ප්‍රචණ්ඩ ක්‍රියා නොවන සිදුවීම් වල නීති උල්ලංඝනයන් එකතුව (රාජ්‍ය බලය හැර)</u>** | **<u>143</u>** | **<u>292</u>** | **<u>405</u>** |
| 11 | වෙනත් සිදුවීම් | 30 | 17 | 26 |
| | **<u>මුලු එකතුව</u>** | **<u>702</u>** | **<u>710</u>** | **<u>672</u>** |

මෙවර ජනාධිපතිවරණය නිදහස් වුවද සාධාරණ නොවූ අතර ඊට බලපෑ සාධක ගණනාවක් විය. එමෙන්ම මැතිවරණයට සෘජු ලෙස බලපාන දීර්ඝ කාලීනව සලකා බැලිය යුතු කරුණු ද රාශියකි. මෙම අන්තර් කාලීන වාර්තාවෙන් බලාපොරොත්තු වන්නේ එම කරුණු පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේත්, ව්‍යවස්ථාදායකයේත් කඩිනම් අවධානය යොමු කිරීමය.

## 1. <u>මාධ්‍ය සමබර කිරීම සඳහා මැතිවරණ කොමිසමට බලතල</u>

මෙවර මැතිවරණයේදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය බහුතරයක් තමන් තෝරාගන්නා අපේක්ෂකයාව ප්‍රවර්ධනය කිරීම සඳහා තම මාධ්‍ය ආයතන මෙහෙය වූ අතර අනෙකුත් අපේක්ෂකයන්ට ලබාදුන් කාලය ද බොහෝ දුරට ඔවුන් පිළිබඳ අප්‍රසාදය ඇති කරන සෘණාත්මක ප්‍රචාරණයක් විය. මේ පිළිබඳව මැතිවරණ කොමිසම උපමාන හා ලිපි අවස්ථා ගණනාවකදී නිකුත් කළ අතර මාධ්‍ය සාකච්ඡා විශාල ප්‍රමාණයක් ද පැවැත්වීය. එහෙත් මාධ්‍ය සමබරව පවත්වා ගැනීමට මැතිවරණ කොමිසම අසමත් වූ අතර ඒ සඳහා නීතිමය වශයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කොමිසමට ප්‍රමාණවත් බලයක් නොවීය. රාජ්‍ය මාධ්‍යය යම් පාලනයකට නතුකර ගැනීමට මැතිවරණ කොමිසමට හැකියාව තිබුනද මැතිවරණයේ අවසන් දින කිහිපය වන විට එයද ඔවුන්ගෙන් ගිලිහී යන තත්ත්වයට පත්විය. මේ සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය ජනාධිපතිවරයාට, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට හා ජනමාධ්‍ය අමාත්‍යංශයට ලිපි යොමුකරන ලදී. ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකරනු ලැබුවේ ජනමාධ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරයා පමණි. රාජ්‍ය මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍ය යන මේ දෙවර්ගයම ජනතාවට හිමි සංඛ්‍යාත භාවිත කරන අතරම විවෘත තරගකාරීත්වය තුළ මේ මාධ්‍ය ආයතන සියල්ලටම එක සමානව තරගයකට මුහුණදීමට සිදුවේ. එබැවින් මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා පහත සඳහන් යෝජනා කරමු.

I. මැතිවරණය ප්‍රකාශයට පත් කළ දින සිට මැතිවරණය අවසන් වී සති දෙකක කාලයක් සඳහා මාධ්‍ය නිරීක්ෂණය කිරීමට හා නියාමනය කිරීමට පූර්ණ බලතල සහිත කමිටුවක් පත් කිරීමට මැතිවරණ කොමිසමට අවශ්‍ය බලය පැවරෙන ආකාරයට නීති සංශෝධනය කිරීම

II. එම කමිටුව මගින් විධිමත් ක්‍රමවේදයකට අනුව මාධ්‍ය ශ්‍රේණිගත කිරීම

III. එම ශ්‍රේණිගත කිරීම් සැලකිල්ලට ගනිමින් සෑම මැතිවරණයක් අවසානයේදීම මධ්‍යස්ථ මාධ්‍ය ආයතන ඇගයීමේ වැඩපිළිවෙලක් මැතිවරණ කොමිසම මගින් ක්‍රියාත්මක කිරීම

IV. එමෙන්ම එහි අවම සීමාව හෝ නොසලකන මාධ්‍ය ආයතනවලට ප්‍රතිඵල ලබාදීම අත්හිටුවීම

V. වාර්ෂික බලපත් දීර්ඝ කිරීමේදී මෙම ශ්‍රේණිගත කිරීම සැලකිල්ලට ගැනීම හා මධ්‍යස්ථ භාවය නොරකින ආරයතනවල බලපත්‍ර දීර්ඝ නොකිරීම හෝ දඩ මුදලක් අය කිරීම

මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ දූෂණ අවම වුවද ජනමාධ්‍ය විශේෂයෙන්ම රූපවාහිනී මාධ්‍ය මගින් කෙරෙන අනිසි බලපෑම මැතිවරණ ප්‍රතිඵලය කෙරෙහි බලපාන බව කිව හැකිය. මෙම තත්ත්වය පාලනය නොකලහොත් අනාගතයේදී මාධ්‍ය ආයතන විසින් රාජ්‍ය නායකයා තීන්දු කරන තත්ත්වයට පත්විය හැකිය.

## 2. සමාජ මාධ්‍ය සමබර කිරීම සඳහා නීති සම්මත කිරීම

2015 ජනාධිපතිවරණයේ සිට මේ දක්වා සමාජ මාධ්‍ය ඉතා වේගයෙන් සමාජය තුළ බලපෑම් කරන කණ්ඩායමක් බවට පත්වී ඇත. ෆේස්බුක්, වට්ස්ඇප්, වයිබර්, ඉන්ස්ටර්ග්‍රෑම්, ට්විටර්, ලින්ක්ඩ්ඉන් ආදී සමාජ මාධ්‍ය ජාලයන් ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛව ක්‍රියාත්මකව අතර ඉදිරි වසර කිහිපය තුළ මෙය තවදුරටත් පුළුල් විය හැක. 2019 ජනවාරි මාසය වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.98 කි. ජනගහනය මිලියන 20.98 ක් වුවද රට තුළ භාවිත කෙරෙන ජංගම දුරකතන ප්‍රමාණය මිලියන 28.71කි. එය වාර්ෂිකව 1.6% ක ප්‍රමාණයකින් වර්ධනය වේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ අන්තර්ජාල භාවිත කරන ප්‍රමාණය මිලියන 7.13 ක් වන අතර ජන සංඛ්‍යාව අතරින් ප්‍රතිශතයක් ලෙස ගැනීමේදී 34% කි.එය වාර්ෂිකව 6.2% කින් වර්ධනය වේ. එමෙන්ම ක්‍රියාකාරී මාධ්‍ය ක්‍රියාකාරීන් මිලියන 6.20 ක් රට තුළ සිටින අතර එය රටේ ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස ගතහොත් 30% ක් ලෙස දැක්විය හැක. එය වාර්ෂිකව 3.3% කින් වර්ධනය වේ. සමාජයත්, මැතිවරණ කොමිසමත් මෙම සමාජ මාධ්‍ය ඵලදායීව සමාජ යහපතට හා නිවැරදි තොරතුරු ගෙන යන ප්‍රවේශයක් බවට පත් කර ගැනීම පිළිබඳ නිර්මාණශීලී ප්‍රවේශයක් සපයා ගත යුතුව ඇත.

මෙවර මැතිවරණයේදී පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිසම හා ෆේස්බුක් ආයතන සමග සමීපව කටයුතු කළ අතර පළමු වරට ෆේස්බුක් පිටු අතරින් දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන්ගේ පිටු ජනප්‍රිය පිටු ඇතුළු ෆේස්බුක් පිටු 11000 ක් නිරීක්ෂණය කළ අතර එම නිරීක්ෂණය මැතිවරණ කොමිසම හරහා ෆේස්බුක් ආයතනවලට යොමු කර යම් පාලනයක් සිදු කිරීමට උත්සාහ දැරීය. එය නිහඬ කාල සීමාව වූ නොවැම්බර් 14, 15 යන දින දෙකක කාලය තුළ සාර්ථකව වුවද සෙසු කාලය තුළ ෆේස්බුක් ආයතන දැක්වූ ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවීය.

**මුළු කාලය තුළ පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමිසමට යොමුකල නිරීක්ෂණ පහත දැක්වේ.**

| | **පූර්ව මැතිවරණ අවධිය** | **නිහඬ කාල සීමාව** | **මැතිවරණ දින** | **පශ්චාත් කාල සීමාව** |
|---|---|---|---|---|
| **මැතිවරණ නීති උල්ලංඝණය කිරීම්** | 186 | 1185 | 266 | 1 |
| **වැරදි තොරතුරු** | 161 | 4 | 3 | 2 |
| **ගැටුම් ඇතිවිය හැකි වැරදි තොරතුරු** | 12 | 0 | 2 | 3 |
| **බලපෑම් කිරීම** | 24 | 1 | 0 | 2 |
| **මානව හිමිකම් උල්ලංඝණය වීම්** | 12 | 0 | 0 | 4 |
| **වෛරී ප්‍රකාශ** | 86 | 1 | 2 | 15 |
| **එකතුව** | **481** | **1191** | **273** | **27** |

**සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් පහත යෝජනා ඉදිරිපත් කරමු.**

I. සමාජ මාධ්‍ය නිදහස් අවකාශය තුළ ක්‍රියාත්මක වන බැවින් ඒවා යම් ප්‍රමාණයකට නියාමනය කිරීම සඳහා විධිමත් නීති සැකසීමට අන්තර්ජාතිකව බලපෑම් කළ යුතුය.

II. මාධ්‍ය ආයතන නියාමන නීති සම්පාදනය කළ වකවානුව තුළ සමාජ මාධ්‍ය ක්‍රියාත්මක නොවූ බැවින් නව මාධ්‍යවලට ගැලපෙන ආකාරයට දේශීයව වර්තමානයේ නව නීති සම්පාදනය විය යුතුය.

III. සමාජ මාධ්‍ය නිදහස් අවකාශය තුළ ක්‍රියාත්මක වුවද මැතිවරණ කාලය තුළ ඒවා නිරීක්ෂණයට හා නියාමනයට ස්වාධීන කමිටුවක් පත් කළ යුතු අතර ඕනෑම මාධ්‍යයක් ඒවායේ ඇති ආවේනික නියාමනයන්ට අමතරව රටේ නීතියට හා මැතිවරණ කොමිසමේ නීත්‍යනුකූල නියෝගවලට අනුගත වන ආකාරයට නීති සම්පාදනය කළ යුතු අතර නොසලකා හරින පිරිස් සඳහා නීතිමය දඬුවම් කළ හැකි ක්‍රමවේදයක් සැකසිය යුතුය.

## 3. ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගැනීම නැවත සලකා බැලිය යුතුය.

ලංකාවේ පසුගිය ජනාධිපතිවරණය සඳහා ඡන්ද මධ්‍යස්ථාන 12845 ක් ක්‍රියාත්මක වූ අතර සමස්තයක් ලෙස ඉතා ඉහළ ප්‍රතිශතයක් එනම් 83% ක් ඡන්දය භාවිත කරන ලදී. එය විදේශගතව සිටින පිරිස අඩුකරනු ලැබුවහොත් සැබෑ ප්‍රතිශතය 90% කට වඩා ඉහළ යා හැක. එය ලෝකයේ ඉහළම සහභාගීත්වයකි. එය මැතිවරණ කොමිසමේ සභාපතිවරයා නිරන්තරයෙන් සඳහන් කරන සුදුසුකම් සහිත සියල්ලන් ඇතුළත් මැතිවරණ ක්‍රමයකට සමාන වේ. එහෙත් එක් ඡන්දදායකයෙකු හෝ අපහසුතාවයට පත් නොවන හා අත්නොහැරෙන ක්‍රමයක් සඳහා ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්නා ලෙස මැතිවරණ කොමිසමෙන් ඉතා ඕනෑකමින් යුතුව ඉල්ලා සිටිමු.

### I. කායික දුබලතා සහිත පිරිස් සඳහා ද බාධාවකින් තොරව යා හැකි ඡන්ද පොළක්

මෙවර මැතිවරණයේදී ඡන්ද මධ්‍යස්ථාන වලින් 14% කදී පමණ ආබාධිත පිරිස් සඳහා ඡන්දය භාවිත කිරීමට ගැටළු මතු වූ බව නිරීක්ෂණය විය. ලංකාවේ භූගෝලීය ස්වභාවය හා ඡන්ද මධ්‍යස්ථාන සඳහා සාම්ප්‍රදායිකව භාවිත කරන ගොඩනැගිලි සියල්ලටම මාර්ග පහසුකම් නොමැතිවීම කෙටිකාලීන විසඳුම් සෙවිය හැකි කටයුත්තක් නොවේ. එහෙත් ඒ සඳහා විකල්ප කිහිපයක් පිළිබඳ අවධානය යොමුකළ හැකිය.

- ග්‍රාම නිලධාරී මහත්ම මහත්මීන් හරහා ඒ ඒ ඡන්ද මධ්‍යස්ථාන ආශ්‍රිතව සිටින ආබාධිත ඡන්දදායක ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් කැඳවීම
- එම වාර්තාවට අනුව එවැනි පිරිස් බහුලව සිටින ප්‍රදේශවලට තාවකාලිකව ඡන්ද පොළ පිහිටුවීම හෝ ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත ගෙනයාමේ ජංගම ක්‍රමවේදයක් සැකසීම
- අවම වශයෙන් ජාතික මැතිවරණවලදී එවැනි පිරිස් සඳහා ඡන්දය භාවිත කිරීමට මැතිවරණ කොට්ඨාස මට්ටමින් අතිරේක ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම් එය ඡන්දය දිනයේදී හෝ ඡන්දයට පෙර විය හැකිය

### II.ඉදිරි මැතිවරණවලදී ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගැනීමේදී ආගමික ස්ථාන තෝරා ගැනීමෙන් හැකිතාක් වැළකී විකල්ප ඡන්ද මධ්‍යස්ථාන තෝරා ගැනීම

මෙවර මැතිවරණයේදී පූර්ව කාලය තුළත් නිහඬ කාලසීමාව තුළත් මැතිවරණ දිනයේදී ආගමික නායකයින් සැලකිය යුතු පිරිසක් සෘජු ලෙසම අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම නිරීක්ෂණය වූ බැවින් ආගමික ස්ථානවල ඡන්දපොළ පැවැත්වීම, දේශපාලන පක්ෂයක ආධාරකරුවකුගේ නිවසක ඡන්ද පොළක් පැවැත්වීම හා සමාන වන බැවින් ආගමික ස්ථාන වෙනුවට විකල්ප ඡන්ද මධ්‍යස්ථාන හෝ

තාවකාලික ඡන්ද මධ්‍යස්ථාන හෝ පිහිටුවීම පිළිබඳ අවධානය යොමුකළ යුතුය. එමෙන්ම ඡන්ද මධ්‍යස්ථාන පිහිටි ආගමික ස්ථානයට පැමිණෙන අදාළ ආගමට අයත් නොවන වෙනත් ආගම්වලට අයත් ඡන්ද හිමියන් ද අනුගමනය කළ යුතු චාරිත්‍ර වාරිත්‍ර හේතුවෙන් අපහසුතාවයන්ට ලක්වූ අවස්ථා ද අපට නිරීක්ෂණය විය.

### III. ඡන්ද දායකයාට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථාන ඡන්ද මධ්‍යස්ථාන ලෙස තෝරාගත යුතුය.

ලංකාවේ දැනට ක්‍රියාත්මක ඡන්ද මධ්‍යස්ථාන වලින් අති බහුතරයක් ඡන්ද දායකයාට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථාන වුවද තවමත් ඡන්ද දායකයාට පහසුවෙන් ළඟාවිය නොහැකි ස්ථාන ද වාර්තා වේ. මෙවර ජනාධිපතිවරණයේදී ගාල්ල දිස්ත්‍රික්කයේ හපුගොල්ල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද දායකයන්ට තම ගමේ සිට පොදු ප්‍රවාහන සේවාව භාවිත කරන්නේ නම් බස් රථ තුනකින් ද නොඑසේ නම් කැලය මැදින් කිලෝමීටර් 3 ක් පමණ පයින් ගමන් කර හෝ දේශපාලන පක්ෂ සංවිධාන කරන වාහනවල ඡන්ද පොළට පැමිණීමට සිදු විය. ( ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ මැදිහත්වීමෙන් වැඩපිළිවෙලක් යෙදුවද එයද අවසන් මොහොතේ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීය) එවැනි මධ්‍යස්ථාන ඇති දැයි ග්‍රාම නිලධාරීන් මගින් ඉදිරි මැතිවරණයට පෙර සොයා බැලිය යුතුය. මෙම තත්ත්වය වළක්වා එවැනි ප්‍රවාහන අපහසුතා ඇති ප්‍රදේශවලට තාවකාලික ඡන්ද මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

### IV. <u>උපතින්ම ආබාධිත අය සඳහා එක්වරක් පමණක් වෛද්‍ය සහතික ලබා ගැනීම</u>

පවතින නීතිය අනුව උපතින්ම ඇස් නොපෙනෙන පුද්ගලයන්ද උපතේදීම ශාරීරික ආබාධ සහිත පුද්ගලයන්ද සෑම මැතිවරණයකදීම වෛද්‍ය සහතික ලබාගත යුතු වේ. එය ඔවුනට මානසිකව හෝ ප්‍රායෝගිකව කරදරකාරී සහ ඡන්දය භාවිත කිරීමට උනන්දුව හීන කරවන්නකි. එබැවින් උපතින්ම ආබාධ සහිත පුද්ගලයන්ට එක්වරක් ලබාදෙන වෛද්‍ය සහතිකය දීර්ඝකාලීනව වලංගු වන ආකාරයට නීති සකස් විය යුතුය.

## 4. <u>ඡන්ද දායකයාට වසර 10 කට එක් ලියාපදිංචි සහතිකයක්</u>

පවතින නීතිමය තත්ත්වය අනුව මැතිවරණය ප්‍රකාශයට පත් කරන විට වලංගු ඡන්ද නාම ලේඛනය භාවිත කිරීමට සිදුවන අතර සමහර අවස්ථාවලදී ඡන්දය දිනය වන විට නව ලේඛනයක් සකස් වුවද එය භාවිත කිරීමට හැකියාවක් නොමැති එබැවින් ඊට අදාළ නීතිය වෙනස් කිරීම හරහා අලුතින් එක්වන ඡන්ද දායකයන්ට ඡන්දය ලබාදීමේ පහසුකම සැලසිය හැකිය.

ශ්‍රී ලංකාවේ ඡන්දදායකයින් ලියාපදිංචිය සෙසු රටවල් සමග සංසන්දනය කිරීමේදී ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මැතිවරණ දෙපාර්තමේන්තුව කොමිසම සමත් වී ඇත. එහෙත් සෑම මැතිවරණයකදීම යම් ඡන්දදායක ප්‍රමාණයකට ඡන්දය භාවිත කිරීමට නොහැකි වේ. මෙවරද දෙහිවල ප්‍රදේශයේ පමණක් 200කට වැඩි පිරිසකට ලියාපදිංචිය නොලැබීම නිසා ඡන්දය භාවිත

කිරීමට නොහැකි විය. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල ඡන්ද ලියාපදිංචිය සිදු කරන කාලය තුළ නිවෙස් හිමියන් විදේශගත වීම හෝ නිවාසවල නොසිටීම වැනි හේතූන් මත ලියාපදිංචිය සිදු නොවන අවස්ථා ඇත. මේ පිළිබඳ ඡන්දදායකයාගේ උනන්දුව ද ඉතා අවමය. මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා අවම වශයෙන් වසර 10කට වලංගු වන සේ ඡන්ද නාම ලේඛනය සකස් කළ හැකි අතර ප්‍රමාණවත් දැනුවත් කිරීමකින් අනතුරුව ලියාපදිංචිය සිදු කිරීම හරහා මෙම තත්ත්වය වළක්වා ගැනීමට හැකිවනු ඇති මේ හරහා රජය වාර්ෂිකව දරන විශාල වියදම ද අවම කර ගත හැක. තම පදිංචිය වෙනස් කරන හෝ වයස 18 සම්පූර්ණ කරන නව සාමාජිකයන් සම්බන්ධයෙන් සහ මියගිය පුද්ගලයන් වාර්ෂිකව නිශ්චිත කාලයක් තුළ ඇතුළත් කිරීම හා ඉවත් කිරීම සිදුකළ හැක. එමෙන්ම මැතිවරණ කැලැන්ඩරයට අනුව මැතිවරණ පැවැත්විය හැකි ක්‍රමයක් ඇතිකළ හැකි නම් සෑම මැතිවරණයකට පෙරම නිශ්චිත කාල රාමුවක් තුළ අතිරේක ලියාපදිංචිය සිදු කිරීම හරහා තරුණ ඡන්දදද මෙයට එකතු කරගත හැකිවනු ඇත.

## 5. හැඳුනුම්පත අනිවාර්ය කිරීම

I. සෑම පුරවැසියෙකුටම ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීම

II. මධ්‍යම තොරතුරු ඒකකය පවත්වා ගැනීම (Central Data Base)

ඡන්දය භාවිත කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඇතුළු මැතිවරණ කොමිෂම පිළිගත් හැඳුනුම්පතක් අනිවාර්යය කිරීමෙන් අනතුරුව ලංකාවේ හොර ඡන්ද දැමීම සම්පූර්ණයෙන්ම වළක්වා ගැනීමට මැතිවරණ කොමිසමට හැකිවියි එහෙත් මෙවර ජනාධිපතිවරණයේදී ඡන්ද දායකයන් කිහිප දෙනෙකුගේ ඡන්දය වෙනත් අ ය විසින් භාවිත කර ඇති බව වාර්තා වියි මේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා එක් ක්‍රමයක් ලෙස ජාතික හැඳුනුම්පත සෑම පුරවැසියෙකුටම අනිවාර්යය කළ යුතුයි එමෙන්ම ජාතික හැඳුනුම්පත ලබාගැනීමට නොහැකි අය සහ ඊට හේතු සොයාබලා ඒ සඳහා ජාතික මට්ටමින් වැඩපිළිවෙලක් සකස් කළ යුතුයි එමෙන්ම එකම නමින් හා අංකයෙන් හැඳුනුම්පත් එකකට වැඩි ප්‍රමාණයක් නිකුත්වීම වාර්තා වී ඇති බැවින් ඒවා වළක්වා ගැනීම සඳහා මධ්‍යම තොරතුරු ඒකකයක් ( Central Data Base) පවත්වා ගත යුතුය.

## 6. ඡන්දදායක හැඳුනුම්පතක් හඳුන්වාදීම

1. ජාතික හැඳුනුම්පත ලබාගත නොහැකි ඡන්දදායකයන් සඳහා දැනට ක්‍රියාත්මක තාවකාලික හැඳුනුම්පත වෙනුවට ස්ථිර ඡන්දදායක හැඳුනුම්පතක් ලබාදිය යුතුය. තාවකාලික හැඳුනුම්පත බොහෝ දුරට ඉල්ලුම් කර ඇත්තේ වැඩිහිටියන් වන බැවින්

ඡන්දයෙන් ඡන්දයට හැඳුනුම්පත් ලබාගැනීමට සිදුවීමෙන් සමහර ඡන්දදායකයන් ඡන්දය ඇති උනන්දුව හීන විය හැකිය.

## 7. දෘශ්‍යාබාධිත පිරිස් සඳහා ඡන්දය භාවිත කිරීමට බ්‍රේල් පහසුකම්

ශ්‍රී ලංකාවේ ඡන්දදායකයින්ගෙන් ලක්ෂ 3කට ආසන්න ප්‍රමාණයක් දෘශ්‍යාබාධිත පිරිස් වන බැවින් එවැනි පිරිස් බහුලව සිටින ප්‍රදේශ හඳුනාගෙන එම ඡන්ද මධ්‍යස්ථාන සඳහා බ්‍රේල් පහසුකම් සැපයීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලෙස යෝජනා කරන අතර ඊට අදාළ නීති සංශෝධනය කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු විය යුතුය.

## 8. Advance Voting System එකක් හඳුන්වාදීම

ලංකාවේ ඡන්දය භාවිත කිරීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගත්ත ද සෑම මැතිවරණයකදීම රට තුළ සිටින පිරිස්වලින් සැලකිය යුතු පිරිසකට වෘත්තීයමය හේතූන් මත ඡන්දය භාවිත කිරීමට නොහැකි වේ. ඒ අතර මැතිවරණ නිරීක්ෂකයින්, වෛද්‍යවරුන්, හෙදියන් පෞද්ගලික ආරක්ෂක අංශ නිලධාරීන් ප්‍රවාහන සේවා වල පිරිස් පෞද්ගලික අංශයේ අත්‍යවශ්‍ය සේවාවල පිරිස් ඡන්දය දිනයේදී විවාහ මංගල්‍යයට යෙදෙන පිරිස් වැනි කණ්ඩායම් සඳහා පූර්ව ලියාපදිංචියක් මගින් ඔවුනට ඡන්දය දිනට පෙර ඡන්දය භාවිත කිරීම සඳහා අවස්ථාව ලබාදිය යුතුයි මෙය පළාත් පාලන මැතිවරණවලදී අපහසු විය හැක. එහෙත් අවම වශයෙන් ජාතික මැතිවරණවලදී මෙම ක්‍රමය හඳුන්වා දිය යුතුය.

## 9. විදේශගත ඡන්දදායකයින්ට ඡන්දය භාවිත කිරීමට පහසුකම්

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය අනුව විදේශගතව සිටින ඡන්දදායකයින්ට ද ඡන්දදායකයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉඩකඩ තිබුණ ද විදේශගත ශ්‍රමිකයන්ට ඡන්දය භාවිත කිරීමට නීතියක් හෝ ක්‍රමවේදයක් අප සතුව නොමැති එමෙන්ම මෙම විදේශගත පිරිස ලංකාවේ පැවැත්මට අවශ්‍ය විදේශ විනිමය වැඩිම ප්‍රමාණයක්  සපයන කණ්ඩායම ද වේ. එම පිරිසට ඡන්දය භාවිත කිරීමට අවස්ථාවක් නොමැතිවීම කණගාටුවට කරුණකි. එබැවින් ඒ සඳහා වැඩපිළිවෙලක් අදියර කිහිපයක් යටතේ හෝ ක්‍රියාත්මක කළ යුතුව ඇත.

I. පළමු අදියර යටතේ තානාපති කාර්යාලවල සේවය කරන පිරිසට මෙම අවස්ථාව වැඩි බාධාවකින් තොරව ලබාදිය හැකි එහෙත් ඒ සඳහා අවශ්‍ය නීති සංශෝධනය විය යුතුය.

II. ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන්ගෙන් අති බහුතරය නුපුහුණු ශ්‍රමිකයන් වන අතර ඔවුන්ගෙන් බහුතරයක් මැද පෙරදිග ගෘහ සේවයේ යෙදෙන්නන් වේ. ඔවුනට තානාපති කාර්යාල හරහා ඡන්දය භාවිත කිරීමට ඉඩ සැලසීම ප්‍රායෝගික නොවනු ඇති එමෙන්ම ඔවුන්ගේ ඡන්දය ස්වාධීනව භාවිත කිරීමට බාධාද ඇති විය හැකිය. එබැවින් ඔවුන්ගේ ඡන්දය ලබා ගැනීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් සහිතව  නීති සම්පාදනය කිරීම කළ යුතුයි විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව රටවල් 16 ක ප්‍රධාන වශයෙන් ශ්‍රී

ලාංකික පුරවැසියන් සේවය කරන බැවින් අවම වශයෙන් එම රටවල් 16 තුළ ඡන්ද මධ්‍යස්ථාන ඇති කිරීම පිළිබඳව අවධානය යොමු කළ හැකියි එබැවින් මේ කරුණු සියල්ල මැතිවරණ කොමිසමත් නීති සම්පාදකයන්ගෙත් අවධානයට ලක්විය යුතුය.

## 10. මැතිවරණ වියදම් සීමා කිරීමේ නීති කඩිනමින් සම්මත විය යුතුය

ඕනෑම මැතිවරණයක නිදහස් හා සාධාරණ භාවය ආරක්ෂා වීමට නම් සම තරඟ බිමක් ක්‍රියාත්මක විය යුතුයි එහෙත් ලංකාවේ එම සම තරඟබිම කිසිදු මැතිවරණයකදී දැකිය නොහැක. එයට බලපාන හේතු ගණනාවක් වන අතර එහි ප්‍රධානතම දුර්වලතාවය මැතිවරණයකදී දේශපාලන පක්ෂ අපේක්ෂක වියදම් සීමා කිරීම සඳහා නීතියක් නොමැති වීමයි සෑම මැතිවරණයකදීම මූල්‍ය ශක්තිය සහිත දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් එහි වාසිය උපරිම ලෙස ලබාගනී. මෙය සැබෑ මහජන මතය නියෝජනය වීමට අභියෝගයකි. එම නිසා දැනටමත් පැෆ්රල් / සී.එම්.ඊ.වී ඇතුලු නිරීක්ෂණ සංවිධාන සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කරන ලද අපේක්ෂක වියදම් සීමා කිරීමේ කෙටුම්පත සම්මත කිරීමට ව්‍යවස්ථාදායකය ක්‍රියාකළ යුතුයි එමෙන්ම මැතිවරණ නීතිය යාවත්කාලීන කිරීම මෙන්ම නව නීති පැනවීම ද සිදුවිය යුතුය.

## 11. පැමිණිලි ඒකකය විධිමත් කිරීම

මැතිවරණයට අදාළ පැමිණිලි සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සමස්තයක් ලෙස සෑහීමකට පත් විය හැකි වුවද එය වඩා කාර්යක්ෂමව සහ විනිවිදභාවයක් සහිතව පවත්වා ගැනීම සඳහා නැවත වරක් මැතිවරණයට අදාළ සියලු පාර්ශ්වයන්ගේ නියෝජිතයින් එම කමිටුවට ඇතුළත් කරන ලෙස යෝජනා කරමු. එමෙන්ම එම පැමිණිලි විමර්ශනය කිරීම හා එහි ප්‍රගතිය ජනතාවට දැනගත හැකි ක්‍රමවේදයක් සකස් කළ හැකි නම් මැතිවරණ කොමිසම කෙරෙහි ඇති විශ්වාසය තවදුරටත් තහවුරු වනු ඇත. මැතිවරණ පැමිණිලිවලදී ප්‍රබල චෝදනා රජයේ ඉහළ තනතුරුලාභීන්ට එල්ල වන බැවින් පැමිණිලි විමර්ශන සඳහා වන කමිටුවට විවිධ ක්ෂේත්‍රවල පිරිස් ද ඇතුළත් කිරීම පිළිබඳව අවධානය යොමුවිය යුතුය. ඒ සඳහා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල සහය ලබාගත හැකි එමෙන්ම එම විමර්ශනවලදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඒකරාශී කිරීම හා මැතිවරණයෙන් අනතුරුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

## 12. මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කර ගැනීම

මැතිවරණ කොමිෂන් සභාව  නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමෙහිලා ඉතා ප්‍රශංසාත්මක උත්සාහයක් ගන්නා ලද අතර එකී කොමිසම සතු බලතල හා ආයතනික ව්‍යුහය සලකා බැලීමේදී එකී උත්සාහය අභියෝගාත්මක ක්‍රියාදාමයක් බව පැහැදිලි කරුණකි. එවන් පසුබිමක් මධ්‍යයේ පවා මැතිවරණ කොමිෂන් සභාව දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය හා සබැඳි නීති කෙරෙහි වරින්වර දැක්වූ ලිහිල් හා මෘදු ප්‍රතිචාරය යම් වෙනසකට ලක්විය යුතුව ඇත. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් මැතිවරණ කෙරෙහි ඍජුව බලපාන්නා වූ නීති සංශෝධනයට උත්සාහයක් නොගන්නා පසුබිමක මැතිවරණ කොමිෂන් සභාව මෘදු භාවිතයන් කරා යොමුවීම ඵල රහිත විය හැකිය. එහිලා වඩාත් සමාජ අවධානයට ලක්වූ අනෙක් කරුණ නම් මැතිවරණ කොමිෂන් සභා සාමාජිකයන් සතුව අවශ්‍යයෙන්ම පැවැතිය යුතු සාමූහිකත්වය බිඳ වැටීමයි. තමන් සාමූහිකව ගන්නා තීරණ කෙරෙහි අගති විරහිතව පෙනී සිටීම හා එකී තීන්දු ආරක්ෂා කිරීම කවර හෝ කොමිෂන් සභාවක ගෞරවය සුරැකෙන කරුණකි. තවද කොමිෂන් සභා සාමාජිකයන් තිදෙනාම එක ලෙස සමස්ත මැතිවරණ ප්‍රචාරක කාලය  තුළම  ඒ වෙනුවෙන් කාලය කැප කිරීම සමස්ත මැතිවරණ ක්‍රියාවලියේ කාර්යක්ෂම බව ඉහළ නංවන සාධකයකි.

## 13. අනවශ්‍ය ලෙස අපේක්ෂකයින් වැඩිවීම වැළැක්වීම සඳහා නීති පද්ධතියක්

මෙවර ජනාධිපතිවරණයේදී අපේක්ෂකයින් 41 දෙනෙක් ඇප තැන්පත් කළ අතර ඉන් 35 දෙනෙක් නාමයෝජනා ඉදිරිපත් කරනු ලැබීය. එම පිරිස අතරින් 20 දෙනෙකුට ආසන්න ප්‍රමාණයක් වෙනත් අපේක්ෂකයින්ට සහය පළ කරන බව මැතිවරණ ව්‍යාපාරය තුළදී තහවුරු විය. එමෙන්ම මැතිවරණ ප්‍රතිඵල අනුව ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා හැර සෙසු සියලුම අපේක්ෂකයින්ගේ ඇප මුදල රාජසන්තක විය. අපේක්ෂකයින් තිදෙනෙකු හැර සෙසු අපේක්ෂකයින් 1% ක ඡන්ද ප්‍රමාණය හෝ ලබාගැනීමට අපොහොසත් විය. එම පිරිස අතරින් අති බහුතරය පුද්ගලික ලාභ අපේක්ෂා පෙරදැරි කරගෙන තරග කරන බව හා ජයග්‍රහණය උදෙසා සැබෑ  අපේක්ෂාවකින් තොරව වෙනත් පක්ෂවලට සහය පළ කිරීමේ අරමුණෙන් තරග කරන බව පැහැදිළි වියි එහෙත් සුළුතර අපේක්ෂකයින් සංඛ්‍යාවක්  ජයග්‍රහණය නොකරන බව දැන දැනම තමන්ගේත් තම පක්ෂයේත් දේශපාලන වැඩ පිළිවෙල, ප්‍රතිපත්ති සමාජගත කිරීම සඳහා තරඟ කරන පිරිස ද මේ මැතිවරණයේදී දැකිය හැකි වූ අතර ඔවුන්ගේ ඉඩකඩ අප ආරක්ෂා කළ යුතුය. එහෙත් අසීමිත ලෙස අපේක්ෂකයින් වැඩිවීම හරහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත වියදම කෝටි 350 කින් පමණ වැඩිවිය. එමෙන්ම ඡන්ද පත්‍රිකාව අඩි දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් දිගු විය. එහි ප්‍රතිඵලයක් ලෙස අලුතින් ඡන්ද පෙට්ටි සකස් කරන්නට සිදුවූ අතර ඡන්ද මධ්‍යස්ථාන පුලුල් කිරීම, ගණන් කරන මධ්‍යස්ථාන පුලුල් කිරීම, ගණන් කිරීමේ නිලධාරීන් වැඩි කිරීම ඇතුළු ප්‍රායෝගික ගැටළු රාශියක් මතු විය. එබැවින් අනාගතයේදී පුද්ගලික ලාභ අරභයා තරග කරන අපේක්ෂකයින් වළක්වමින් සැබෑ දේශපාලන අරමුණු මත තරග කරන පක්ෂ හා අපේක්ෂකයින් ආරක්ෂා වන ආකාරයට නව නීති සම්පාදනය විය යුතුය. ඒ සඳහා පහත යෝජනා ඉදිරිපත් කරමු.

1. අපේක්ෂක ඇප මුදල අවම වශයෙන් ලක්ෂ 10 දක්වා වත් වැඩි කළ යුතුය.

2. තරඟ කරන දේශපාලන පක්ෂ වර්ෂය පුරාම දේශපාලන කටයුතුවල නිරත වූ බවට සහතිකයක් නිර්ණායකවලට ඇතුලත් කළ යුතුය.

3. ජනාධිපති ධූරය අපේක්ෂා කරන දේශපාලන පක්ෂයට ඒ සඳහා මහජන පදනමක් තිබිය යුතු බැවින් තරග කරන පක්ෂවල අවම වශයෙන් වසර 5කට වැඩි කාලයක් පළාත් පාලනයේ නම් සභිකයන් 25 ක් පළාත් සභා නම් සභිකයන් 05 ක් පාර්ලිමේන්තු නම් එක් මන්ත්‍රීවරයෙක් වත් සිටිය යුතු බවට නිර්ණායකයක් ඇතුළත් කළ යුතුය.

4. ඉහත නිර්ණායක සැපිරීමට අපොහොසත් දේශපාලන පක්ෂයක් තම ජයග්‍රහණය පිළිබඳව විශ්වාසයෙන් තරග කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඔවුනට ඒ සඳහා ඉඩකඩ ලබාදිය යුතු අතර□ එහෙත් ඔවුන් 1% ක වත් ඡන්ද ප්‍රතිශතයක් ලබා ගැනීමට අපොහොසත් වන්නේ නම් ඔවුන්ගෙන් අවම වශයෙන් මිලියන 10 ක් හෝ මැතිවරණ කොමිසමේ වියදමෙන් යම් ප්‍රතිශතයක් අයකර ගැනීමට නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුයි එවැනි පක්ෂවල ඇප මුදල මිලියන 10 ක් හෝ ඊට වැඩි මුදලක් විය යුතුය.

5. දේශපාලන පක්ෂ වාර්ෂිකව මැතිවරණ කොමිෂමට ලබාදිය යුතු අයවැය, වාර්ෂික වාර්තා, නිලධාරීන්ගේ වත්කම් බැරකම් සම්පූර්ණ කල යුතුය. ඒ අනුව මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් සතියක් ඇතුළත තරඟ කළ හැකි පක්ෂ පිළිබඳව මැතිවරණ කොමිෂම ප්‍රකාශයක් නිකුත් කළ යුතුය.

6. ස්වාධීන අපේක්ෂක අපේක්ෂිකාවන්ගේ ඇප මුදල ලක්ෂ 50 දක්වා වැඩි කළ යුතුය.

## 14. **පක්ෂ ලියාපදිංචි කිරීමේ නීති සංශෝධනය විය යුතුය**

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පක්ෂ 70 ක් ක්‍රියාත්මක වුවද එයින් 50% වත් මැතිවරණ වලදී තරඟ කරනු දැකිය නොහැකි එමෙන්ම මෙම පක්ෂවලින් සැලකිය යුතු ප්‍රමාණයක් කිසිදු දේශපාලන ක්‍රියාවක නොයෙදෙන අතර මැතිවරණ කොමිසමට ලබාදිය යුතු නිල ලේඛන හෝ නියමිත කාලයට ලබාදීමට අපොහොසත් වේ. නමුත් මැතිවරණවලදී ඔවුන් විශාල මිල ගණන්වලට අලෙවි වන බවට චෝදනා එල්ල වේ. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් අනාගතයේදී සැබෑ දේශපාලන පරමාර්ථයෙන් තොරව අනවශ්‍ය ලෙස දේශපාලන පක්ෂ ලියාපදිංචි වැළැක්වීම සඳහා නීති සම්පාදනය කළ යුතුය. එමෙන්ම පක්ෂ ලියාපදිංචියේදී පක්ෂවල විධායක මණ්ඩල සඳහා අවම වශයෙන් කාන්තාවන් සඳහා 30% ක පමණ හෝ නියෝජනයක් ඇති වන ආකාරයට නීති සම්පාදනය කළ යුතුය.

සමහර දේශපාලන පක්ෂ තනි පුද්ගලයෙකු මත ක්‍රියාත්මක වන අතර විධායක මණ්ඩල වල තිදෙනෙකු හෝ ඊට අඩු පක්ෂ 5 කට වැඩිය. මෙවැනි පක්ෂ බොහෝ දුරට ජනපදනමක් නොමැති පක්ෂය. මෙම තත්ත්වයන් වළක්වා ගැනීමට පක්ෂ ලියාපදිංචි කිරීමේ නිර්ණායක ගැන නැවත සලකා බැලිය යුතුය. එමෙන්ම දැනට තිබෙන දේශපාලන පක්ෂද ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය මත දිගටම පවත්වාගෙන යන්නේද පිළිබඳව සලකා බැලිය යුතුය.